**03-12-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ දැන් පූජනීයත්වයෙන් ඉහළම, පරම පියාගේ උකුලට පැමිණ ඇත. ඔබගේ සිතිවිලි වලින් පවා ඔබ පූජනීය (පිවිතුරු) විය යුතුයි.

**ප්‍රශ්නය:** ඉහළින්ම පූජනීය දරුවන්ගේ කුල්මත්භාවය කුමක්ද, එමෙන්ම ඔවුන්ගේ සලකුණු මොනවාද?

**පිළිතුර:** ඉහළින්ම පූජනීය පියාගේ උකුල ගැනීමේ කුල්මත්භාවය ඔවුන්ට ඇත. ඔවුන් වඩාත්ම පූජනීය දේවතාවන් බවට පත්වෙමින් සිටිනවා. ඔවුන්ගේ සිතට නරක සිතිවිලි ඇතුළු විය නොහැක. ඔවුන් සුවඳැති මල් වන අතර කිසිම විටෙක වැරදි ක්‍රියාවක් සිදු නොකරයි. ඔවුන් ඇතුලාන්තයට බරව සිට, තමන්ව පරීක්ෂා කර බලයි: සෑම කෙනෙකුටම මගෙන් සුගන්ධය ලැබෙනවාද? මගේ දෑස කුමකට හෝ ඇදී යනවාද?

**ගීතය:** ඔබේ මාවතේ දිවි ගෙවන්නත්, ඔබේ මාවතේ මියැදෙන්නත්...

ඕම් ශාන්ති. ඔය දරුවන්ට ගීතය ඇසුණා. ඔබ ඇතුලාන්තයෙන් එය ආවර්ජනය කර, එහි අරුත උකහා ගත යුතුයි. ඔබගේ මාවතේ මියැදෙන්නට කියා පැවසුවේ කවුද? මෙසේ පැවසුවේ ජීවාත්මයයි, මන්ද අපවිත්‍ර වී තිබෙන්නේ ජීවාත්මය බැවින්. ඔබ අවසානයේ පිවිතුරු වීමට යනවා, එසේ නැත්නම්, ඔබට පිවිතුරු සිරුරක් ලැබුණු විට ඔබ පිවිතුරු වන බව ඔබට කිව හැක. වර්තමානයේ ඔබ උත්සාහ දරන්නන්ය. ඔබ පරමාත්ම පියා වෙතට පැමිණෙන්නේ මියැදෙන්නට බව ඔබ දන්නවා. එක් පියෙක් අතහැර තවත් කෙනෙක් ගැනීම යනු, එක් කෙනෙකුට මිය ගොස්, අනෙක් කෙනා සමඟ දිවි ගෙවීමයි. භෞතික පියෙකුගේ දරුවෙක් ඔහුගේ සිරුර අත්හළ විට, ඔහු ගොස් තවත් පියෙකුට උපත ලබයි. මෙහි සිදුවන්නේද එයමයි. ඔබ මියැදී, ඉන්පසුව ඉහළින්ම පූජනීය පරම පියාගේ උකුල ගනී. ඉහළින්ම පූජනීය කෙනා කවුද? (පරමාත්ම පියා). එමෙන්ම පූජනීය වන්නේ කවුද? (සන්යාසීන්). ඔව්, සන්යාසීන් පූජනීය බව කියයි. සන්යාසීන් සහ ඔබ අතර වෙනසක් තිබේ. ඔවුන් පූජනීය වන නමුත් ඔවුන් නැවත උපත් ගන්නේ අපවිත්‍ර අය මාර්ගයෙනි. ඔබ දැන් ඉහළින්ම පූජනීය අය බවට පත්වනවා. ඔබව මෙය බවට පත් කරවන්නේ ඉහළින්ම පූජනීය වූ පරමාත්ම පියාය. ඒ මිනිසුන් පූජනීය වීම සඳහා ඔවුන්ගේ නිවෙස් හැර යයි. පිවිතුරු වන්නේ ජීවාත්මයයි. දිව්‍ය ලෝකයේදී ඔබ දේවතාවන්ය, එබැවින් ඔබ ඉහළින්ම පූජනීයයි. ඔබගේ අත්හැරීම අසීමිත වන අතර ඔවුන්ගේ අත්හැරීම සීමිතයි. ඔවුන් පූජනීය වන අතර, ඔබ ඉහළින්ම පූජනීයත්වයට පත්වෙයි. ඔබ දැන් නව ලෝකයට යන බව, බුද්ධිය පවසයි. සන්යාසීන් පැමිණෙන්නේ එය රජෝ කාලය වන විටයි, එමෙන්ම රජෝ වීම සහ සතෝප්‍රධාන් වීම අතර වෙනසක් තිබේ. ඔබ ඉහළින්ම පූජනීයත්වයට පත් වන්නේ, ඉහළින්ම පූජනීය පරමාත්ම පියාගේ මාර්ගයෙනි. ඔහු ඥාන සාගරය මෙන්ම සෙනෙහසේද මහා සයුරයි. ඉංග්‍රීසියෙන් එය කියැවෙන්නේ ‘Ocean of Knowledge, Ocean of love’ කියාය. ඔහු ඔබව බොහෝ ශ්‍රේෂ්ඨත්වයට පත් කරවයි! ඔබ උසස්ම-උසස්, ඉහළින්ම පූජනීය ඔහුට අඬගසන්නේ පැමිණ, අපවිත්‍ර අයව පිවිතුරු කරන්න! අපවිත්‍ර ලෝකයට පැමිණ, අපව ඉහළින්ම පූජනීයත්වයට පත් කරන්න. එබැවින් අපට උගන්වනනේ කවුරුන්ද, යන කුල්මත්භාවය, ඔය දරුවන්ට තිබිය යුතුයි! අප කවුරුන් බවටද පත්වන්නේ? තවද ඔබ දිව්‍යමය ගුණධර්මද ධාරණය කරගත යුතුයි. දරුවන් ලියන්නේ බාබා, මායා අපට බොහෝ කුණාටු ගෙන එයි. ඇය අපට සිතිවිලි වලින් පිවිතුරු වීමට ඉඩ නොදෙයි. අප ඉහළින්ම පූජනීයත්වයට පත් විය යුතු බැවින්, අපට එවන් නරක සිතිවිලි ඇතිවන්නේ ඇයි? පරම පියා පවසන්නේ වර්තමානයේ ඔබ මුළුමනින්ම, පූජනීය නොවන අය බවට පත්ව ඇත. දැන් බොහෝ උපත් වල අවසානයේදී, පරමාත්ම පියා පූර්ණ බලය යොදා ඔබට උගන්වයි. එබැවින් දරුවනි, ඔබ පත්වන්නේ කවුරුන් බවටද, යන කුල්මත්භාවය ඔබගේ බුද්ධියට තිබිය යුතුයි. ලක්ෂ්මී සහ නාරායන්ව එය බවට පත් කළේ කවුද? භාරතය, දිව්‍ය ලෝකය විය. මෙකල භාරතය, තමෝප්‍රධාන් මෙන්ම දූෂිතය. අප දැන් එය, ඉහළින්ම පූජනීයත්වයට පත් කරවනවා. එය එසේ පත් කරවන, ඒකායන කෙනා අනිවාර්යෙන්ම සිටිය යුතුයි. ඔබ දේවතාවන් විය යුතුයි, යන කුල්මත්භාවය ඔබගේ ඇතුලාන්තයේ තිබිය යුතුයි. ඒ සඳහා, ඔබට එවන් ගුණධර්මද තිබිය යුතුයි. පහළම අඩියේ සිට ඔබ දැන් ඉහළට නැඟ තිබේ. ඉනිමඟ පිංතූරයේ ’නැග්ම සහ බැස්ම’ කියා ලියා තිබේ. පහළට වැටී ඇති අය, තමන් ඉහළින්ම පූජනීය අය බව කියාගන්නේ කෙසේද? පැමිණ, ඔය දරුවන්ව එය බවට පත් කරවන්නේ, ඉහළින්ම පූජනීය වූ පරමාත්ම පියා පමණයි. ඔබ මෙහි

පැමිණ ඇත්තේ ලෝක අධිපතියන්, ඉහළින්ම පූජනීය අය, බවට පත් වීම සඳහාය. එබැවින් ඔබට බොහෝ කුල්මත්භාවය තිබිය යුතුයි. බාබා පැමිණ ඇත්තේ අපව බොහෝ ශ්‍රේෂ්ඨ කරවීටයි. ඔබගේ සිතිවිලි, වචන සහ ක්‍රියා වලින් පිවිතුරු වන්න. සුවඳැති මලක් වන්න. ස්වර්ණමය යුගයට කියන්නේ මල් උයන කියාය. කිසිම දුගන්ධයක් නොතිබිය යුතුයි. ශරීර අවධානය, දුගන්ධයක් බව කියැවෙයි. කිසිම කෙනෙක් කෙරෙහි කිසිම නරක දැක්මක් නොතිබිය යුතුයි. ඔබගේ ගිණුමට බැර වන, ඔබගේ යටි හිතට වද දෙන අන්දමේ, කිසිම වැරදි ක්‍රියාවක් ඔබ සිදු නොකළ යුතුයි. ඔබ ධනය රැස් කරගන්නේ උපත් 21 කටයි. ඔබ බොහෝ ධනවත් වන බව, ඔය දරුවන් දන්නවා. ජීවාත්මය වන ඔබ දෙස බලා, ඔබ සියලුම දිව්‍යමය ගුණධර්ම වලින් පිරී ඇත්දැයි පරීක්ෂා කර බලන්න. බාබා පවසන අන්දමට මා උත්සාහ දරනවාද? බලන්න, ඔබගේ අරමුණ සහ ඉලක්කය කුමක්ද කියා! ඔබලා සහ සන්යාසීන් අතර විශාල වෙනසක් ඇත. ඔබ පැමිණ තිබෙන්නේ කාගේ උකුලටද යන කුල්මත්භාවය ඔය දරුවන්ට තිබිය යුතුයි. ඔහු අපව පත් කරවන්නේ කුමක් බවටද? අභ්‍යන්තර ගතවී, ඔබ කෙතරම් ප්‍රමාණයකට වටිනා අය බවට පත්ව ඇත්ද කියා පරීක්ෂා කර බලන්න. සෑම කෙනෙකුටම ඥානයේ සුගන්ධය ලැබෙන අන්දමට, අප කෙතරම් ලස්සන විය යුතුද! ඔබ මෙම සුගන්ධය බොහෝ දෙනෙකුට ලබා දෙයි. ඔබ අන් අයව ඔබ හා සමාන කරවයි. ඔබට උගන්වන්නේ කවුරුන්ද, යන කුල්මත්භාවය ඔබට පළමුවෙන්ම තිබිය යුතුයි! ඒ සියලුම මිනිසුන් භකිත් මාර්ගයේ ගුරුන්ය. පරම පියා, පරමාත්ම ජීවය හැර, ඥාන මාර්ගයේ, වෙනත් ගුරුන් සිටිය නොහැක. අන් සියලු දෙනාම අයත් වන්නේ භක්ති මාර්ගයටයි. භක්තිය සිදුවන්නේ කලි යුගයේය. රාවණ ඇතුළු වන්නේ එවිටයි. ලෝකයේ කිසිවෙකු මෙය නොදනී. ඔබ ස්වර්ණමය යුගයේ සිටි විට, ඔබ දිව්‍යමය කලාවන් 16 කින් පිරී සිටි බව, ඔබ දන්නවා. එක දිනක් හෝ ගෙවී ගිය පසු, ඔබ එයට පූර සපළොස්වක දා යැයි නොකියයි. මෙහිද එය එසේමයි. චක්‍රය දිගටම උකුණෙක් මෙන් ටිකින් ටික කරකැවෙයි. ඔබ දැන් දිව්‍යමය කලාවන් 16 කින් පිරිය යුතුයි, තවද එය චක්‍රයෙන් භාගයකටයි. ඉන්පසුව කලාවන් දිගින් දිගටම අඩු වීගෙන යයි. මෙම ඥානය ඔබගේ බුද්ධිය තුළ තිබේ, එබැවින් ඔබට බොහෝ කුල්මත් බවක් තිබිය යුතුයි. ඔවුන්ට උගන්වන්නේ කවුරුන්ද කියා බොහෝ දෙනෙකුගේ බුද්ධියට ඇතුළු වන්නේ නැත. ඥානයේ මහා සාගරය! ඔහු ඔය දරුවන්ට පවසන්නේ නමස්කාර දරුවනි. ඔබද බ්‍රහ්මාන්ඩ් වල අධිපතියන්ය. සෑම කෙනෙක්ම එහි වාසය කරයි ඉන්පසුව ඔබ ලෝකයේද අධිපතියන් වෙයි. ඔබගේ උද්යෝගය වැඩි කිරීම සඳහා පරමාත්ම පියා පවසන්නේ ඔබ මටත් වඩා උසස් වනවා! මම, ලෝකයේ අධිපති වන්නේ නැහැ. මම ඔබව මගේ ප්‍රශංසාවටත් වඩා ඉහළ ප්‍රශංසා ඇති අය බවට පත් කරවන්නෙමි. දරුවන් ඔවුන්ගේ පියාට වඩා ශ්‍රේෂ්ඨ වන විට, ඔවුන් ඉගෙන ගැනීමෙන් උසස් තත්ත්වයක් හිමිකරගෙන ඇති බව, පියාට වැටහෙයි. පරමාත්ම පියා මෙසේද පවසයි ඔබට උගන්වන්නේ මමයි. දැන් ඔබට අවශ්‍ය තත්ත්වය හිමි කරගැනීම සඳහා, උත්සාහ දරන්න. අපට උගන්වන්නේ පරම පියාය. එබැවින්, පළමුවෙන්ම මෙම කුල්මත්භාවය ඉහළ නැඟිය යුතුයි. ඔහු මෙම කෙනා තුළ සිටින නිසා පරමාත්ම පියාට ඕනෑම විටෙක පැමිණ ඔබට කතා කළ හැක. ඔය දරුවන් අයත් වන්නේ ඔහුට නේද? මෙම රථය අයත් වන්නේ ඔහුට නොවේද? එබැවින් පරම පියා, ඉහළින්ම පූජනීය කෙනා, ඔබව පිවිතුරු කිරීමට පැමිණ සිටිනවා. ඔබ දැන් අන් අය පිවිතුරු කළ යුතුයි. මම විශ්‍රාම යනවා. ඔබ ඉහළින්ම පූජනීයත්වයට පත් වූ විට, කිසිම අපවිත්‍ර කෙනෙකුට මෙහි පැමිණිය නොහැක. මෙය, ඉහළින්ම පූජනීය කෙනාගේ පල්ලියයි. එම පල්ලි වලට යන සියලුම දෙනා අපවිත්‍රයි. සියල්ලන්ම අපවිත්‍රයි, එමෙන්ම පූජනීය නොවෙයි. මෙය ඉතා විශාල පූජනීය පල්ලියක්. කිසිම අපවිත්‍ර ජීවයකට මෙහි පය තැබිය නොහැක. කෙසේවෙතත්, ඔබට දැන් මෙය කළ නොහැක. ඔය දරුවන්ද මෙසේ වූ විට, සියලුම නීති ක්‍රියාත්මක කෙරෙයි. වෙනත් කිසිවෙකුට ඇතුලට පැමිණීමට නොහැකි වෙයි. ඔවුන්ට පැමිණ මෙම සමූහයේ අසුන් ගැනීමට හැකිද කියා සමහරුන් විමසයි. බාබා පවසන්නේ ඔබට නිලධාරීන් ආදිය සමඟ වැඩ කිරීමට සිදුවෙයි, එබැවින් ඔවුන්ට මෙහි අසුන් ගැනීමට ඔබ ඉඩ දිය යුතුයි. ඔබගේ නාමය කීර්තිමත් වූ පසු, ඔබට වෙනත් කිසිවෙක් ගැන සැලකිලිමත් වීමට අවශ්‍ය නොවෙයි. දැන් ඔබ තවමත් මෙම සැලකිල්ල පවත්වා ගත යුතුයි ඉහළින්ම පූජනීය අය වුවද, ඉඩ දිය යුතු වනවා. වර්තමාන කාලයේදී ඔවුන්ට 'බැහැ' කියා කීමට ඔබට නොහැක. ඔබගේ බලපෑම පැතිරෙන විට, මිනිසුන්ගේ එදිරිවාදිකම් ද අඩුවනු ඇත. බ්‍රහ්මණයන් වන ඔබට රාජයෝගාව උගන්වන්නේ පරමාත්ම පියා, ඉහළින්ම පූජනීය කෙනා බව, ඔබ එවිට විස්තර කරනු ඇත. සන්යාසීන්ට ඉහළින් පූජනීය අය යැයි කිව නොහැක. ඔවුන් පැමිණෙන්නේ රජෝ සමයෙදි පමණයි. ඔවුන්ට ලොවෙහි අධිපතියන් වීමට හැකිද? ඔබ දැන් උත්සාහ දරන්නන්ය. ඇතැම් විට ඔබගේ හැසිරීම යහපත් වන අතර, ඇතැම් විට ඔබ නමට අපහාස ගෙන අන්දමට හැසිරෙයි. මධ්‍යස්ථාන වලට පැමිණෙන බොහෝ දෙනෙකුට එම හඳුනාගැනීම නොමැත. ඔබ පත්වන්නේ කවුරුන් බවටද කියාත් ඔබට අමතක වෙයි. ඔබ කුමක් බවට පත්වෙයිද කියා ඔබගේ හැසිරීමෙන් පියාට

වටහා ගැනීමට පුළුවනි. ඔබගේ භාග්‍යයේ උසස්ම තත්ත්වයක් තිබේ නම්, ඔබ විශාල රාජකීයත්වයකින් හැසිරෙයි. ඔබට උගන්වන්නේ කවුරුන්ද කියා පමණක් සිහියේ තබාගන්න, එවිට ඔබ තුළ පුපුරා යන අන්දමේ සතුටක් ඔබට අත්විඳිය හැක. අපි දෙවි පියාණන්ගේ ශිෂ්‍යයන්ය, එබැවින් ඔහු කෙරෙහි විශාල ගෞරවයක් තිබිය යුතුයි. මේ මෙහොතේ ඔබ තවමත් ඉගෙනගනිමින් සිටිනවා. තව දුරටත් ටික කාලයක් ගත වන බව පියාට වැටහෙයි. සෑම දෙයක්ම අංක පිළිවෙලටයි. ගොඩනැගිල්ලක් වුවද පළමුවෙන් සතෝප්‍රධාන් වන අතර පසුව එය සතෝ, රජෝ සහ තමෝ තත්ත්ව හරහා යයි. ඔබ දැන් සතෝප්‍රධාන් සහ දිව්‍යමය කලා 16 ක් සම්පූර්ණ වීමටයි යන්නේ. ගොඩනැගිල්ල ගොඩනැගෙමින් පවතිනවා. ඔබ සියලු දෙනාම එකට, දිව්‍ය ලෝකයේ ගොඩනැගිල්ල ගොඩනඟනවා. වැඩියෙන්ම පූජනීයත්වයක් නොමැති භාරතය, දැන් සියල්ලට වඩා පූජනීය කරවීම ගැන ඔබ තුළ විශාල සතුටක් තිබිය යුතුයි. එබැවින් ඔබ තමන්ව බොහෝ සේ ප්‍රවේශම් කරගත යුතුයි. ඔබගේ තත්ත්වය විනාශ වන අන්දමේ දැක්මක් ඔබට නොතිබිය යුතුයි. මෙසේ නොසිතන්න මා මෙය බාබාට ලියන්නේ නම්, බාබා මොනවා සිතයිද? නැත. සෑම කෙනෙක්ම මෙකල උත්සාහ දරමින් සිටිනවා. ඔහුටවත් ඉහළින්ම පූජනීය යැයි මෙකල කිව නොහැක. ඔහු එය බවට පත් වූ පසු, මෙම සිරුරවත් මෙහි ඉතිරි වන්නේ නැත. ඔබත් ඉහළින්ම පූජනීයත්වයට පත්වෙමින් සිටිනවා. කෙසේවෙතත්, තත්ත්වයේ විවිධ වෙනස් මට්ටම් තිබේ. ඒ සඳහා ඔබ සම්පූර්ණයෙන් උත්සාහ දරා, අන් අයටත් උත්සාහ දැරීමට දිරි ගැන්විය යුතුයි. බාබා ඔබට දිගින් දිගටම අළුත් කරුණු ලබා දෙයි. කෙනෙක් පැමිණි විට ඔහුට පූජනීය සහ ඉහළින්ම පූජනීය යන දෙක අතර වෙනස පෙන්වා දෙන්න. ලක්ෂ්මී සහ නාරායන්, ස්වර්ණමය යුගයේ උපත ලබයි අන් අය පසුව පැමිණෙන බැවින් විශාල වෙනසක් තිබේ. ශිව බාබා ඔබව කවුරුන් බවට පත් කරවනවාද කියා ඔය දරුවන්ට වැටහෙයි. ඔහු පවසන්නේ නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න. තමන් අශාරීරික ජීවාත්මයක් බව සලකන්න. උසස්ම-උසස් ශිව බාබා ඔබට උගන්වා, ඔබව උසස්ම-උසස් බවට පත් කරවයි. අපි ඉගෙන ගන්නේ බ්‍රහ්මගේ මාර්ගයෙනි. බ්‍රහ්ම, විෂ්ණු බවට පත් වෙයි. මෙය දන්නේ ඔබ පමණයි. මනුෂ්‍යයින්ට කිසි දෙයක් වැටහෙන්නේ නැත. එය දැන් මුළු ලෝකය පුරාම රාවණගේ රාජධානියයි. ඔබ දැන්, ඔබ පමණක් දන්නා, රාමාගේ රාජධානිය ස්ථාපිත කරනවා. නාටකයට අනුව දිව්‍ය ලෝකය ස්ථාපිත කිරීමට සුදුසු අය බවට අපි පත්වනවා. බාබා දැන් අපව වටිනා අය බවට පත් කරවනවා. පරමාත්ම පියා හැර වෙනත් කිසිවෙකුට අපව සාම දේශයට හෝ සතුටු දේශයට ගෙන යා නොහැක. 'අභවලා දිව්‍ය ලෝකයට ගියා' හෝ 'නිවනට ගියා' යැයි ඔවුන් පවසන විට, ඔවුන් දිගින් දිගටම පවසන්නේ ගොතන ලද කතාය. පරමාත්ම පියා පවසන්නේ දූෂිත සහ අපවිත්‍ර ජීවාත්ම, සාම දේශයට යන්නේ කෙසේද? ඔබට කෙතරම් ආධ්‍යාත්මික කුල්මත්භාවයක් තිබේද කියා, ඔවුන්ට වැටහෙන පරිදි, ඔබට ඔවුන්ට මෙය කිව හැක. අපි ඔවුන්ට විස්තර කර දෙන්නේ කෙසේද කියා, ඥානයේ මහා සයුර කලතන්න. ඔබ ඇවිදින අතර සහ එහෙ මෙහෙ යන අතර, ඔබ තුළ මෙම හැඟීම තිබිය යුතුයි වටිනා අය වීම සඳහා අපට ඉවසීම තිබිය යුතුයි. සම්පූර්ණයෙන් වටිනා මෙන්ම සම්පූර්ණයෙන්ම නොවටිනා අය බවට පත් වන්නේද වෙනත් කිසිවෙකු නොව, භාරතයේ ජනතාවයි. පරම පියා දැන් ඔබව වටිනා අය බවට පත් කරවනවා. මෙම දැනුම බොහෝ විනෝදජනකයි. අපි මෙම භාරතය, ඉහළින්ම පූජනීයත්වයට පත් කිරීමට යනවා, යන විශාල සතුට ඇතුලාන්තයේ තිබේ. බොහෝ සේ රාජකීය හැසිරීමක් තිබිය යුතුයි. ඔබගේ කෑම, බීම සහ හැසිරීමෙන් සෑම දෙයක්ම කිව හැක. ශිව බාබා ඔබව බොහෝ උසස් බවට පත් කරවනවා! ඔබ ඔහුගේ දරුවන් වී ඇති බැවින් ඔබ ඔහුගේ නාමය කීර්තිමත් කළ යුතුයි. ඔබගේ හැසිරීම කෙසේ විය යුතුද යත්, ඔබ ඉහළින්ම පූජනීය කෙනාගේ දරුවන් බව ඔවුන්ට වටහාගැනීමට හැකි විය යුතුයි. ක්‍රම-ක්‍රමයෙන් ඔබ දිගටම මෙය බවට පත් වෙයි. ඔබගේ ප්‍රශංසාව අඛණ්ඩව ඉස්මතු වෙයි. එවිට කිසිම අපවිත්‍ර ජීවයකට ඇතුලට පැමිණිය නොහැකි ආකාරයට, සියලුම නීති රීති ක්‍රියාත්මක වනු ඇත. ඔබට තව කාලය අවශ්‍ය බව බාබාට වැටහෙයි. ඔබගේ රාජධානිය සූදානම් විය හැකි වන පරිදි, ඔය දරුවන් බොහෝ උත්සාහ දැරිය යුතුයි. ඉන්පසුව මෙම නීති ක්‍රියාත්මක වන විට ඉන් එලක් නොවනු ඇත. එකල, මෙහි සිට පහළ අබූ පාර තෙක් දිග පෝලිමක් තිබෙයි. බලන්න, ඔබ තව තව ප්‍රගතිය කරා යන විට වන දේ. බාබා අඛණ්ඩව ඔබගේ වාසනාව වැඩි කරනවා. ඔබ කෝටි ගුණයකින් (පද්මපදම්) භාග්‍යවන්ත බව නිවැරදිව කියැවෙයි. ඔවුන් දෙපා අභියස නෙළුමක් (පදම්) පෙන්වයි. ඒ සියල්ල ඔය දරුවන්ගේ ප්‍රශංසාවයි. කෙසේවෙතත්, පරමාත්ම පියා පවසන්නේ : මන්මනභාව්! පරම පියා සිහි කරන්න! අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගේ යටි හිතට වද දෙන අන්දමේ කිසිම ක්‍රියාවක් සිදු නොකරන්න. මුළුමනින්ම සුවඳ මලක් වන්න. ශරීර අවධානය නමැති දුගඳ ඉවත් කරගන්න.
2. ඔබගේ හැසිරීම බොහෝ සෙයින් රාජකීය විය යුතුයි. ඉහළින්ම පූජනීයත්වයට පත් වීම සඳහා සම්පූර්ණ උත්සාහය දරන්න. ඔබගේ තත්ත්වය විනාශ වන අන්දමේ දැක්මක් ඔබට නොතිබිය යුතුයි.

**වරදානය:**

**පාඨය:** **අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

***** ඕම ශාන්ති *****

කර්මතීත් යන්නෙන් අදහස් කරන්නේ සියලු ආකාරයේ සීමිත ස්වභාවයන්ගෙන් සහ සංස්කාර වලින් වෙන් වීමයි. සීමිත ඕනෑම දෙයක් බන්ධනයක් වන අතර අසීමිත ඕනෑම දෙයක් බන්ධනයෙන් නිදහස් වීම වේ. දැන්, බ්‍රහ්ම බාබා හා සමානව, "මගේ" යන ඕනෑම සීමිත අවධානයෙන් නිදහස් වී අව්‍යක්ත දිනය සමරන්න. මෙය සෙනහසේ සාක්ෂිය ලෙස හැඳින් වේ.